# ශ්‍රීලාල්ගේ කොළම

## අනාවැකි

''මේ පාර අබේගුණෝගෙත් පස්ස බිම ඇනිලා නේද?''

පළාත් සභා මැතිවරණයේ ප්‍රතිපල ගැන මැතිවරණ නිරීක්ෂකයන් විදිහට අපේ නිරීක්ෂණ ගැන කතා බහ කරමින් ඉන්න තැනට කඩාපාත්වුණ මිත්‍රයෙක් එයාගේ නිරීක්ෂනයක් ඉදිරිපත් කළා. අපි මොහොතකට නිරුත්තර වුණේ කවුද මේ ''අබේගුණෝ'' කියලා එකපාරටම නිනව්වක් නැතුව ගිය නිසා. දයාසිරි, ජොහාන්, අනුරාධ, ප්‍රමිත, එස්බී වගේ මැතිවරණ කාලය පුරාම නිතර නිතර කියැවුණ නම් අතරේ නම් ''අබේගුණෝ'' කෙනෙක් හිටියේ නෑ.

''කවුද අබේගුණෝ?'' අපි මිත්‍රයගෙන් ඇහුවා.

''ඇයි දන්නේ නැත්ද? අර රාජකීය ජ්‍යෝතිෂවේදියා. ජොනීගේ පුතා එකට එනව කියලා මෑන් අනාවැකියක් කියලා තිබුණනේ. ඒ වුණාට එකට ආවේ දයාසිරි.''

ඔය විදිහට අපේ මිත්‍රයා විස්තර ප්‍රචාරය පටන් ගත්තම තමයි අපි පිලිගත වුණේ.
මේ රාජකීය ජ්‍යෝතිෂවේදියා අද වෙනකොට රටේ නාමධාරී අනාවැකිකරුවෙක්. උන්නැහේ නිතර නිතර ආණ්ඩුවේ මාධ්‍යවල පෙනී ඉන්නවා. ජ්‍යෝතිෂ වැඩසටහන්වලට සහභාගි වෙනවා. ඒ වැඩසටහන් ඉදිරිපත් කරන්නන් උන්නැහේව හඳුන්වන්නේ ''රාජකීය ජ්‍යෝතිෂඥ'' කියන බහුමාන පදවි නාමයකින්. හේතුව ජනාධිපතිවරයාගේ සකලවිධ අවශ්‍යතාවයන්ට ජ්‍යෝතිෂ උපදේශකත්වය සපයන්නේ උන්නැහේ නිසා. (එහෙම කියන්නේත් උන්නැහේමයි)
පළාත් සභා මැතිවරණයේදී වයඹ පළාත් සභාවට කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් තරග කළ ජොහාන් ප්‍රනාන්දු (ඇමැති ජොන්ස්ටන්ගේ පුතා) මැතිවරණයෙන් එකට එනවා කියලා උන්නැහේ කියපු අනාවැකියක් ජනමාධ්‍ය ගණනාවක් මැතිවරණයට කලින් වාර්තා කරලා තිබුණා. ඒ වාර්තා කිරීම්වල කිසියම් වරදක් තියනවා කියලා උන්නැහේ මැතිවරණ ප්‍රතිපළ පිටවෙනකම් කිසිම තැනකදී කියලා තුබණ බවක් නම් වාර්තා වෙලා නෑ.

කොහොම හරි අන්තිමේදි මැතිවරණයෙන් ජොහාන්ට වඩා ඡන්ද ලක්ෂ දෙකක් අරගෙන එකට ආවේ දයාසිරි. මේ මැතිවරණ ප්‍රතිපලය ප්‍රකාශයට පත්වුණාට පස්සේ ආණ්ඩුවේ නොවෙන ජන මාධ්‍ය ''රාජකීය ජ්‍යෝතිෂඥය'' ''පතුරු ගහන්න'' පටන් ගත්තා.

''ජොහාන් ගැන කියපු අනාවැකිය බොරු වුණා නේද?'' කියලා උන්නැහේගෙන් මාධ්‍ය අහනකොට උන්නැහේ දීලා තිබුණ උත්තරය මේං.

''මැතිවරණයට ආසන්න දින නවයක් තුළ ප්‍රධාන මාධ්‍ය හතක් මා සමඟ වැඩසටහන් කළා. ජ්‍යෝතිෂය අනුව මා දයාසිරි හෝ ජොහාන් ගැන කිසිවක් කීවේ නෑ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට පළවෙනියා වෙන්න බෑ කියලා ඒ එක තැනකදිවත් මම කියලා නෑ. ජොහාන් ප්‍රනාන්දු කතෝලික. එයාට කේන්දරයක් නෑ. එයාගේ පියා ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමැතිතුමාටත් එතුමාගේ බිරියටත් කේන්දර නෑ. ඉතිං මම කොහොමද ජ්‍යෝතිෂයට අනුව ජොහාන් ගැන අනාවැකි කියන්නේ.''

තමන් ජොහාන් ගැන කියූ අනාවැකිය බොරු වුණා කියලා මාධ්‍ය කියන කතාව ඔන්න ඔය විදිහට ප්‍රතික්ෂේප කරමින් ''රාජකීය ජ්‍යෝතිෂඥයා'' මෙන්න මෙහෙම වැඩිදුර පැහැදිලි කිරීමකුත් කරලා තිබුණා.

''ජොන්ස්ටන් ප්‍රනාන්දු අපේ පවුලේ සමීප හිතවතෙක්. ජොහාන් නාම යෝජනා දෙන දවසේ මම හිටියේ කුරුණෑගල ජොන්ස්ටන්ගේ ගෙදර. මේ දරුවට ලොකු ආත්ම ශක්තියක් දෙන්න ඕනේ නිසා නාම යෝජනා දෙන්න යන්න ජොහාන් ගෙදරින් එළියට බහිද්දි මම කිව්වා 'වයඹ අපේක්ෂකයන් 37ක් ඉන්නවා. ඔබ ලාබාල කොල්ලෙක්. පළමුවෙනියා වෙනවා. විශිෂ්ඨ ජයක් ලබනවා' කියලා ආශිර්වාද කළා. එච්චරයි. ඒක සුබ පැතුමක්. මාධ්‍ය ඒක වාර්තා කළේ වෙන විදිහකට.''
උන්නැහේ කියන විදිහට අනාවැකිය කියලා තියෙන්නේ උන්නැහේ නෙවෙයි. මාධ්‍ය. උන්නැහේ කරලා තියෙන්නේ සුබ පැතීමක්.

........

ජ්‍යෝතිෂය ගැන ගැඹුරු හැදෑරීමක් කරන ජ්‍යෝතිෂවේදියෙක් කියුව පැරණි කතන්දරයක් මට මතක් වුණා.

එකමත් එක කාලෙක, එකමත් එක රටක, එකමත් එක ගමක ''ටක්කෙට'' අනාවැකි කියන ජ්‍යෝතිෂවේදියෙක් හිටියා. ගැබ්බර මවකගේ කුසේ ඉන්නේ ගැහුණු දරුවෙකුද පිරිමි දරුවෙකුද කියලා මෙයා කියන අනාවැකියක් කිසිම දවසක වැරදිලා නෑ(ලු). මේ කාලේ වගේ ස්කෑනින් ක්‍රම නොතිබුණ ඒ කාලේ ලැබෙන්න ඉන්න දරුව ගැන අනාවැකි අහන්න මේ ජ්‍යෝතිෂවේදියා හොයාගෙන බරටම සෙනඟ එනවා. ඒ නිසා ජ්‍යෝතිෂවේදියාටත් හොඳ බර.

අනාවැකියක් කිව්වම ඒ ගැන සටහනක් තමන් ළග තියන පොතේ ලියන පුරුද්දකුත් මේ ජ්‍යෝතිෂවේදියාට තිබුණා. කලාතුරකින් හරි කෙනෙක් දරු ප්‍රසූතියෙන් පස්සේ තමන්ට කියූ අනාවැකිය වැරදුනා කියාගෙන ආවොත් මෙයා අර සටහන් පොත එළියට ඇදලා අරගෙන බලනවා. ඊට පස්සේ පැමිණිලිකාරයටත් පෙන්නනවා ''මේ තියෙන්නේ'' කියලා. පොතේ තියන සටහන කොහොමත් බොරු වෙන්න බෑනේ. අන්තිමේ පැමිණිලිකාරයෝ යනවා කියන්නේ තමන්ගේ මතකයේ සිදුවෙච්ච පටලැවිල්ල ගැන ජ්‍යෝතිෂවේදියාගෙන් සමාවත් ඉල්ලලයි.

මේ රාජකීය නොවරදින අනාවැකි කීමේ ක්‍රමවේදය හෙළිකරගන්න හිතලා ඒ පළාතේ කෙනෙක් උපාය දූතයෙක් දැම්මා මේ ජ්‍යෝතිෂඥයාගේ කාර්යාලේ ආවතේව වැඩවලට. සෑහෙන කාලයක් එතන ගත කරලා උපාය දූතයා අන්තිමේ වැඩේ අල්ලගත්තා.

වැඩේ මෙහෙමයි. කෙනෙක් තමන්ට ලැබෙන ඉන්න දරුවා දුවෙක්ද පුතෙක්ද කියලා බලාගන්න මේ ජ්‍යෝතිෂඥයා ළගට ආවම තමන් දන්න ග්‍රහ ගණිතයට අනුව ගැනලා මෙයා අනාවැකිය කියනවා. අනාවැකියෙන් කියැවුණේ පුතෙක් ලැබෙනවා කියලා නම් මෙයා තමන් ළග තියන අර සටහන් පොතේ ලියනවා ''දුවෙක් ලැබෙනවා'' කියලා. අනාවැකියෙන් කියැවුණේ දුවෙක් ලැබෙනවා කියලා නම් අර සටහන් පොතේ ලියනවා ''පුතෙක් ලැබෙනවා'' කියලා.
තමන්ට කියැවුණ අනාවැකිය වැරදියි කියලා කවුරු හරි කෙනෙක් යම් වෙලාවක ආවොත් මෙයා ඇදලා ගන්නවා අර සටහන් පොත. පෙරළනවා දිනේට අදාළ පිටුව. පෙන්නනවා පොතේ තියන සටහන ''මේ තියෙන්නේ'' කියලා. පොත බැලුවම පැමිණිලිකාරයගේ ඇස් උඩ යනවා. පොතේ හරියට තියනවානේ. එහෙනම් මටම තමයි එදා වරදින්න ඇත්තේ කියලා හිතලා පැමිණිලිකාරයා ආපහු යන්නේ ජ්‍යෝතිෂවේදියාට වැදලා සමාවත් ඉල්ලලයි.

මේ ජ්‍යෝතිෂවේදියා මැරෙනකම්ම ඔහු කියුව කිසිම අනාවැකියක් බොරුවෙලා නම් නැතිලු. හැබැයි ඒ ජ්‍යෝතිෂවේදියා නම් මිය පරලොව ගිහිල්ලා දැන් කාලයක් වෙනවලු.

17 +years of experience..
1000s of success stories...
that counts

THE IMMIGRATION LEGAL ADVISORY SERVICE OF THE SRI LANKAN COMMUNITY

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

457 Visas
Employer Nominations (ENS)
Regional Sponsored Migration Scheme (RSMS)
Employer Contracts
Negotiations of employer nominations with the Australian Employers
General Skill Migration Permanent Residence
General Skill Migration Provisional Residence
Second stage Skilled Regional (Permanent Residence)
State Sponsored Skill Migration
Graduate Skill Temporary visas
Complex Student visas
Skill Assessments
State Sponsorships
TRA cancellations
Criminal Prosecutions on TRA cancellations
Student Visa Cancellations
Permanent residence Cancelations
Appeals to the Migration Review Tribunal (MRT)
Administrative Review Tribunal (AAT)
Business Migration State Sponsorships
Business Migration visas
Spouse & visas
Aged Parent visas
Contributory Parent visas
Resident Return visas
Australian Citizenships

Susantha Katugampala LL B (Monash)
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA SPECIALIST ACCREDITATION

Sushendra Fernando LL B (Monash)
Associate

Lindy Noone
Migration Consultant
MARN: 0322507

Frank Sabelberg LL B (Monash)
Consulting Solicitor
MARN: 0004726

Michael Gros LL B (Monash)
Consulting Barrister
MARN: 9803398

Melbourne
FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE
10, Morrison Place
East Melbourne Victoria 3002
Telephone: +61 3 9650 4557
Interstate Callers: 1300 888 331
Fax: +61 3 9650 4559
Mobile: +61 417 851 041

Colombo
AUSTRALIA GATEWAY
Australian Migration Consultants
Hilton Colombo Towers
200 Union Place Colombo 02
Telephone: +94 11 2300 627
Mobile: +94 777 347 670
+94 717 347 670
E: info@fairfieldslawyers.com

We Deliver Results..